# ඇබෑර්තු

**සතොස**

රජය සතු විශාලතම අලෙවිසැල් ජාලය සඳහා

## ජ්‍යෙෂ්ඨ කළමණාකරු - තොග ගබඩා (HM - 1-1)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

(01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ සැපයුම් කළමනාකරණය/ සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ වාණිජ්‍ය/ ව්‍යාපාර පරිපාලනය/ අලෙවිකරණය / ගිණුම්කරණය හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්,

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්)

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක කළමණාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද.

(02) තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය.

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක කළමණාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2) :**

(01) ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.

(02) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමණාකාර මට්ටමේ (MM) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**වැටුප් හා අනෙකුත් දීමනා :** වැටුප් පරිමාණය HM 1-1 රු.(80,295 - 15 x 2,270 - 114,345) මූලික වැටුප රු. 80,295/-
(ඊට අමතරව රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.)
(ප්‍රවාහන දීමනාව රු. 50,000 + රජයේ චක්‍රලේඛයන්ට අනුව තනතුරට අදාළ අනුමත ඉන්ධන දීමනාව + ජංගම දුරකථන ප්‍රතිපූර්ණ දීමනාව රු.5,000/- (මාසික) මෙම තනතුර සඳහා හිමිය)

**පත්වීමේ ස්වභාවය :** ස්ථිර සහ සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට හිමිකම් ඇත.

**සුදුසුකම්ලත් අයදුම්කරුවන්,**

- දත්ත අගයුම්කිරීමේ, සමාලෝචනය කිරීමේ, අර්ථ නිරූපණය කිරීමේ හැකියාව සමග විශිෂ්ඨ විශ්ලේෂණාත්මක ගැටළු විසඳීමේ සහ සංවිධානමය කුසලතා තිබිය යුතුය.ඉහළ ස්වයං අභිප්‍රේරණයක් සහිත පුද්ගලයෙකු විය යුතුය.
- ඉහළ නායකත්ව ගුණාංග, අන්තර් පුද්ගල සන්නිවේදන හැකියාවන්ගෙන් යුක්ත විය යුතුය.
- ප්‍රශස්ත මට්ටමේ තොරතුරු තාක්ෂණ හැකියාවෙන් යුක්ත විය යුතුය.
- බහුවිධ කණ්ඩායම් මෙහෙයවීමට සහ අධීක්ෂණය කිරීමට හැකි බවට සනාථ කළ හැකි සාධක තිබිය යුතුය. මානව සහ වෙනත් සම්පත් කාර්යක්ෂමව කළමණාකරණයට හා නිසි ලෙස යෙදවීමට පළපුරුද්ද තිබිය යුතුය.

**අනෙකුත් සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් හෙබි අයෙකු විය යුතුය.

III. විශිෂ්ට පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය.

ඔබට නියමිත සුදුසුකම් හා පළපුරුද්ද ඇතිනම්, ඔබගේ ජීවදත්ත ලේඛනය, සහතික වල ඡායා පිටපත් සමග මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. නැතිනම් **vacancies@lankasathosa.org** යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න (ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි / විද්‍යුත් තැපැල් පණිවුඩයෙහි **"Subject"** හිරැසෙහි සඳහන් කළ යුතුය).

(ආයතනය ලිපි ගනු දෙනු කරනු ලබන්නේ ලේඛන ගත තෝරාගත් අයදුම්කරුවන් සමග පමණි.)

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්, සතොස මහලේකම් ගොඩනැගිල්ල,
අංක 27, 05 වන මහල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

වෙළඳ අමාත්‍යාංශය

**සතොස**